平等機會委員會
EQUAL OPPORTUNITIES COMMISSION

# වෙනස් කොට සැලකීමට එරෙහි ආඥාපනත්වලට සංශෝධන

## මෙම සංශෝධන කුමක් සඳහාද?

වෙනස් කොට සැලකීමට එරෙහි ව්‍යවස්ථාව (විවිධ සංශෝධන) 2020 සහ ලිංගිකත්වවය මත වෙනස් කොට සැලකීමේ (සංශෝධන) ආඥා පනත 2021 (ආඥාපනත ) මගින් දැනට පවතින වෙනස්කොට සැලකීමට එරෙහි වීමට අදාල පනත් වන, ලිංගිකත්වය මත වෙනස් කොට සැලකීමට එරෙහි පනත (SDO), ආබාධිත තත්වය මත වෙනස් කොට සැලකීමට එරෙහි පනත (DDO), පවුල් පසුබිම මත වෙනස් කොට සැලකීමට එරෙහි පනත (FSDO), හා ජාතිකත්වය මත වෙනස් කොට සැලකීමට එරෙහි පනත (RDO) යන පනත් හතර සඳහා සංශෝධන ඉදිරිපත් කර ඇත.

## මෙම ආඥාපනත් බලාත්මක වන්නේ කෙදින සිටද?

මෙම ආඥාපත්වල සියලු විධිවිධාන, එය ගැසට් කල දිනය වන 2020 ජූනි 19 වන දින සිට බලාත්මක වන අතර, මව්කිරි ලබාදීමේදී වෙනස් කොට සැලකීම හා පීඩාවට පත් කිරීම හා සම්බන්ධ ව්‍යවස්ථාගත නියෝග මෙම දිනයේ සිට මාස 12කට පසු, එනම් 2021 ජූනි 19 දින සිට බලාත්මක වේ.

## මෙම ආඥාපනත මගින් සිදුකල සංශෝධන මොනවාද?

මෙම සංශෝධන මගින් පහත ලයිස්තු ගත කර ඇති පරිදි, ලිංගිකත්වය, අබාධිතබව හා වර්ගවාදය මත සිදුවන වෙනස්කොට සැලකීම් , මෙන්ම ලිංගික අතවර, මව්කිරි දීමේදී කාන්තාවන් පීඩාවට පත් කිරීම, අබාධිතබව හා වර්ගවාදය මත සිදුවන්නාවූ අතවර වලින් ආරක්ෂාව සලසා ඇත.



මව්කිරි ලබාදෙන මව්වරුන් හට, සේවාස්ථානයේදී, භාණ්ඩ, පහසුකම් හා සේවා සපයන ස්ථානවලදී, අධ්‍යාපනායතන, පරිශ්‍ර කළමණාකරන හා බැහැර කිරීමේ ස්ථාන, සමාජශාලා, සහ රාජ්‍ය උත්සව වලදී සෘජු හෝ වක්‍රාකාරව සිදුවන්නාවූ වෙනස්කොට සැලකීම්, පීඩා කිරීම් වලින් ආරක්ෂාව SDO මගින් සලසා ඇත.

මව්කිරි ලබාදීම හා සම්බන්ධ ව්‍යවස්ථාගත නියෝග මගින් පහත අවස්ථා ආවරණය කරනු ලබයි.

- කාන්තාවක් දරුවෙකුට මව්කිරි දෙමින් සිටින විට;
- කාන්තාවක් දරුවෙකු වෙනුවෙන් මව්කිරි දෝවනය කරමින් සිටින විට;
- වෙනස්කමකට ලක්වන අවස්ථාවේ නොකළත්, මව්කිරි දීමෙන් දරුවෙකු පෝෂණය කරන කාන්තාවක් නම් ;

**භාණ්ඩ ප්‍රවාහනය කරන සේවකයින්, ස්වේච්ඡා සේවකයින් සහ සීමාවාසිකයන් වැනි රැකියා සබඳතා නොමැතිව සේවා ස්ථාන වලට සහභාගීවන්නන් හට ලිංගිකත්වය මත, අබාධිතබව මත හා වර්ගවාදය මත සහ මව් කිරි දීමේදී සිදුවන වෙනස්කොට සැලකීම් සහ අතවරවලට ගොදුරුවීම් වලින් ආරක්ෂාව SDO, DDO සහ RDO මගින් සලසා ඇත.**

**ස්වේච්ඡා සේවකයෙක් යනු** - සේවා යෝජකයෙකුගේ හෝ සේවකයකුගේ කාර්යභාරයෙන් තොර වූ ස්වේච්ඡාවෙන් සේවයේ යෙදෙන පුද්ගලයෙකු.

**සීමාවාසිකයෙක් යනු** - සීමාවාසික පුහුණුවක් සඳහා වෙනත් අයෙකු සමග කටයුතු කරන නමුත් එම පුද්ගලයාගේ සේවකයෙකු නොවන අයෙක්.

**සීමාවාසික පුහුණුව යනු** - ශිෂ්‍යත්වයක් ද ඇතුළත්ව වෘත්තීය හෝ අධ්‍යාපන සුදුසුකම් ලබා ගැනීම සඳහා නිශ්චිත කාලසීමාවක් තුල සේවය කිරීමක් හෝ, සීමාවාසික පුහුණුවක් ලෙස විස්තර කෙරෙන වෙනත් කාලසීමාවක්.

**ආබාධිත තත්ත්වය මත හෝ වර්ගවාදය මත, සේවා සපයන්නන් හට (ඕනෑම කලාපයක ඇති, හොංකොං රජයේ ලියාපදිංචි ගුවන් යානා හා නැව්ද ඇතුලත්ව) පාරිභෝගිකයින් විසින් සිදු කරන අතවර වලින් ආරක්ෂාව DDO හා RDO මගින් තහවුරු කර ඇත.** (සටහන: ඉහත ආරක්ෂණය SDO, DDO සහ RDO මගින් දැනට පනවා ඇති ක්‍රියාමාර්ග වලට අමතරව පනවා ඇත. පෙර සිටම SDO, DDO සහ RDO මගින් භාණ්ඩ, පහසුකම් හා සේවා සපයන්නනන් විසින් පාරිභෝගිකයන් හට ලිංගිකත්වය මත, ආබාධිත තත්ත්වය මත හා වර්ගවාදය මත සිදු කරන අතවර වලින් ආරක්ෂාව සපයා තිබිණි. 2014 වසරේ සිට භාණ්ඩ, පහසුකම් හා සේවා සපයන්නනන් හට (ඕනෑම කලාපයක ඇති හොංකොං රජයේ ලියාපදිංචි ගුවන් යානා හා නැව්ද ඇතුලත්ව) පාරිභෝගිකයන් විසින් සිදුකරන ලිංගික අතවර වලින් ආරක්ෂාව තහවුරු කිරීමට සංශෝධන ඉදිරිපත් කර ඇත).

**මහජනතාවට සෘජු හෝ වක්‍රාකාරව, ජාතිකත්වය මත සිදු කරනා වෙනස් කොට සැළකීම් වලින් හා වාර්ගික හිංසන (පුද්ගලයෙක් යම් වාර්ගිකයෙක් හෝ යම්**

**වාර්ගික කණ්ඩායමකට අයත් වූවකු ලෙස චෝදනාවට ලක්වීම) වලින් ආරක්ෂාව RDO මගින් සලසා ඇත.**

**වර්ගවාදය මත පදනම්ව සිදුකරන, ඍජු වෙනස්කම් කිරීම් හා වාර්ගික හිංසනයෙන් යම් පුද්ගලයෙකු ආරක්ෂා කිරීම RDO මගින් සිදුකරයි. (මෙහිදී තමාගේ වර්ගය නිසා හෝ තම ආශ්‍රිතයකුගේ වර්ගය නිසා අඩු සැලකිලි වලට ලක්වීම සිදුවිය හැක).**

**ආශ්‍රිතයෙක් යනු:** තම සැමියා හෝ බිරිඳ, තමන් සමග වෙනයම් බැඳීමකින් එකට වෙසෙන පුද්ගලයෙක්, ඥාතියෙක්, උපස්ථායකයෙක්, තමන් සමග ව්‍යාපාරයේ යෙදෙන අයෙක් හෝ ක්‍රීඩා හා විනෝද කටයුත්තක යෙදෙන අයෙක්.

**භාරකරු යනු:** සමාජ සුබසාධන අධ්‍යක්ෂක, සමාජ සුබසාධන දෙපාර්තමේන්තුවේ ඕනෑම බලයලත් නිලධාරියෙකු හෝ RDO හි 6 වන උප ලේඛනයෙහි දක්වා ඇති ඕනෑම පුද්ගලයෙකු.

**සමාජශාලා කළමනාකරුවන් විසින් එහි සාමාජිකයින් හා සාමාජිකත්වය අපේක්ෂා කරන අයවලුන් හට ලිංගිකත්වය මත හා ආබාධිත තත්ත්වය, මව් කිරි දීම මත සිදුකරන අතවර වලින් ආරක්ෂාව තහවුරු කිරීම.**

**SDO, FSDO හා RDO පනත් යටතේ වක්‍රව වෙනස් කොට සැලකීම සඳහා වන්දි ප්‍රදානය කිරීමේ පූර්ව කොන්දේසියක් ලෙස වෙනස් කොට සැලකීමේ අභිප්‍රාය අවලංගු කිරීම.**

---

**මෙම ආඥාපනතේ අදාල සංශෝධන පිළිබඳ වැඩි විස්තර ලබා ගන්නේ කෙසේද?**

මෙම ආඥාපනතට සම්පූර්ණ අන්තර්ගතය පහතින් ලබාගත හැක.

https://www.gld.gov.hk/egazette/pdf/20202425/es1202024258.pdf

තවද, සම අවස්ථා පිළිබඳ කොමිසම (EOC) විසින් මෙම සංශෝධන පිළිබඳ මාර්ගෝපදේශ මාලාවක් සකස් කර ඇති අතර එය මෙම වෙබ් පිටුව www.eoc.org.hk හරහා ලබාගත හැක.

---

## සම අවස්ථා කොමිසම වෙත පැමිණිල්ලක් සිදු කල හැක්කේ කෙසේද?

මෙම කෙටුම්පත් වල දක්වා ඇති කරුණු යටතේ ඕනෑම අයෙකුට, තමන්ව වෙනස් කොට සැලකීමකට, අතවරයකට හෝ අපවාදයකට ලක් වී ඇතැයි හැඟේ නම්, ඒ පිළිබඳ පැමිණිල්ලක් සම අවස්ථා කොමිසම වෙත ලිඛිතව පහත ඕනෑම ආකාරයකින් ඉදිරිපත් කල හැක.

තැපැල් මගින්

EOC වෙබ් පිටුව හරහා (Online form on the EOC) website

ෆැක්ස්

EOC කාර්යාලයට පැමිණීමෙන්

ප්‍රති-වෙනස්කොට සැලකීමේ ආඥා පනත පිළිබඳ විමසීම්: On-line Enquiry Form
ප්‍රති-වෙනස්කොට සැලකීමේ ආඥා පනත පිළිබඳ පැමිණිලි: On-line Complaint Form
EOC සේවයන් පිළිබඳ විමසීම් සහ පැමිණිලි : On-line Form

---


### සම අවස්ථා පිළිබඳ කොමිසම හා සම්බන්ධ වීමට:

දුරකථන: (852) 2511 8211 (සාමාන්‍ය විමසීම් සඳහා පමණි)

ෆැක්ස්: (852) 2511 8142

ලිපිනය: 16/F, 41 Heung Yip Road, Wong Chuk Hang, Hong Kong.

විද්‍යුත් තැපැල: eoc@eoc.org.hk (සාමාන්‍ය විමසීම් සඳහා පමණි)

කෙටි පණිවිඩ සේවාව: 6972566616538 (ශ්‍රවණාබාධිත හෝ භාෂණයේ දුෂ්කරතා ඇති පුද්ගලයින් විසින් සිදු කරන විමසීම් සඳහා පමණි)


(වෙනස් කොට සැලකීමට අදාළ විමසීම් හා පැමිණිලි සඳහා ඉහත අන්තර්ජාල පෝරම භාවිතා කිරීමට සැලකිලිමත් වන්න)


**සම අවස්ථා පිළිබඳ කොමිසම**

**April** 2021


සටහන: මෙම පත්‍රිකාව නිර්දේශයක් පමණක් වන අතර කිසියම් වූ ආකාරයක නීති උපදේශයක් සඳහා ආදේශයක් ලෙස භාවිතා නොකල යුතුය.